දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) NA/08/01/2024
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி )2024.04.02
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

**පොදු චක්‍රලේඛ ලිපි අංක - 02-55/2024**

සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
ශ්‍රී ලංකා ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියළුම ශික්ෂණ රෝහල් හා මහ රෝහල් අධ්‍යක්ෂවරුන්
වෛද්‍ය අධිකාරිවරුන්/විශේෂිත ව්‍යාපාර අධ්‍යක්ෂවරුන්
අදාල ආයතන ප්‍රධානීන් වෙත

**<u>සෞඛ්‍ය අංශයේ කාර්යය මණ්ඩලය සඳහා නිල ඇඳුම් දීමනා සංශෝධනය</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2014.01.29 දිනැතිව නිකුත් කරන ලද අංක 02-09/2014, 02-10/2014, 02-11/2014, 02-12/2014, 02-13/2014 හා 2014.12.19 දිනැතිව නිකුත් කරන ලද 02-175/2014 යන පොදු චක්‍රලේඛ ලිපි හා බැඳේ.

02. සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල ඇඳුම් දීමනා හිමි පහත තනතුරුවල නිලධාරීන් සඳහා අනුමත නිල ඇඳුම් දීමනා පහත වගුවේ සඳහන් පරිදි සංශෝධනය කිරීමට භාණ්ඩාගාර ලේකම්ගේ අංක BD/HRD/111/09/2024 හා 2024.03.18 දිනැති ලිපියෙන් එකඟතාවය ලබා දී ඇත.

| තනතුරු නාමය | වසරකට දැනට ගෙවනු ලබන දීමනාව (රු.) | 2024 වර්ෂයේ සංශෝධිත නිල ඇඳුම් දීමනාව (රු.) | 2024 වර්ෂය සඳහා වැඩි කරන ලද ප්‍රමාණය (රු.) | 2025.01.01 දින සිට සංශෝධිත දීමනාව (රු.) |
|---|---|---|---|---|
| හෙද නිලධාරී | රු. 15,000/- | රු. 25,000/- | රු.10,000/- | රු. 30,000/- |
| පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී | රු. 14,000/- | රු. 23,000/- | රු.9,000/- | රු. 28,000/- |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරී | රු. 15,000/- | රු. 25,000/- | රු.10,000/- | රු. 30,000/- |
| මැලේරියා/බරවා මර්ධන සහයක මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී, කීට විද්‍යා සහකාර, පාසල් දන්ත චිකිත්සක | රු. 10,300/- | රු. 17,000/- | රු.6,700/- | රු. 20,600/- |
| පශු එන්නත්කරු, සත්ත්ව ඒකක පාලක, සෞඛ්‍ය රියදුරු | රු. 9,300/- | රු. 15,000/- | රු.5,700/- | රු. 18,600/- |

| | | | | |
|---|---|---|---|---|
| **කණිෂ්ඨ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය**<br>සෞඛ්‍ය කාර්ය සහයක(කණිෂ්ඨ/සාමාන්‍ය)<br>උපස්ථායක (කාන්තා/පිරිමි)<br>රෝහල් ඕවර්සියර්,අරක්කැමි,කරණවැමි<br>විදුලි සෝපාන ක්‍රියාකරු<br>කාර්යාල කාර්ය සහයක,<br>පාපැදි පණිවුඩකරු, මුරකරු<br>රසායනාගාර සහයක<br>ඉසින යන්ත්‍ර ක්‍රියාකරු | රු. 9,300/- | රු. 15,000/- | රු.5,700/- | රු. 18,600/- |

03. ඒ අනුව භාණ්ඩාගාර ලේකම්ගේ ඉහත එකඟතාව පරිදි නිල ඇඳුම් හිමි තනතුරු සඳහා 2024 වර්ෂය සඳහා වැඩි කරන ලද නිල ඇඳුම් දීමනාව 2024 මැයි මස සිට ගෙවීමට හා 2025 වර්ෂයට හිමි සංශෝධිත නිල ඇඳුම් දීමනාව 2025 මාර්තු මස ගෙවීමට මෙයින් අනුමැතිය ලබා දෙමි.

04. නිල ඇඳුම් සම්බන්ධව නිකුත් කර ඇති චක්‍රලේඛවල අනෙකුත් විධිවිධාන ඒ අයුරින්ම ක්‍රියාත්මක වන බව වැඩිදුරටත් දන්වමි.

වෛද්‍ය පී.ජී. මහීපාල
සෞඛ්‍ය ලේකම්

**වෛද්‍ය පී. ජී. මහීපාල**
**ලේකම්**
**සෞඛ්‍ය අමාත්‍යාංශය**
**"සුවසිරිපාය"**
**385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,**
**කොළඹ 10.**

පිටපත් -

01. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය - දැ.ගැ.ස.
02. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - දැ.ගැ.ස.
03. අධ්‍යක්ෂ ජනරාල්, කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස.
04. විගණකාධිපති - දැ.ගැ.ස.